# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1795/29 - 2013 ජනවාරි මස 30 වැනි බදාදා - 2013.01.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

**බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 වැනි වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණය**

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල හා බල ශක්ති, මිනිස් බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතන වල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් කරුණු/චෝදනා හේතු කොටගෙන මීරිගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආනන්ද ප්‍රේමචන්ද්‍ර රණවීර කටයුතු කිරීමේදී ඉහත කී ප්‍රඥප්තියේ 2(1) වගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් සිදු කර තිබේද යන්න පරීක්ෂාකර මාස 3ක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ඒක පුද්ගල පරීක්ෂණ සභාවක් වශයෙන් විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු බී. එල්. කේ. විමලචන්ද්‍ර මැතිතුමා පත් කරමි.

පරීක්ෂා කළ යුතු කරුණු/චෝදනා නම්,

(අ) ආනන්ද ප්‍රේමචන්ද්‍ර රණවීර මහතා 2011.04.04 දින හෝ ඊට ආසන්න දිනක සිට මේ දක්වා කාල සීමාව තුළ මීරිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් මීරිගම, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ "වලව්වත්ත නමැති ඉඩමේ ආරම්භයේ සිට ප්‍රධාන මාර්ගය දක්වා වන කොටසේ කාණු කැපීම" සඳහා වන කර්මාන්තය විධිමත් ටෙන්ඩර් කැඳවීමකින් තොරව පල්ලෙවෙල, වල්බෝලාන, අංක 72හි පදිංචි වයි. ඒ. අර්ජුන ධර්මප්‍රිය යන අයට පවරා ඉටු කිරීමට සැලැස්වීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 174 වගන්තියට පටහැනිව ක්‍රියාකර බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියෙහි 2(1)අ හා/හෝ 2(1)ඇ වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

(ආ) ආනන්ද ප්‍රේමචන්ද්‍ර රණවීර මහතා 2011.04.04 දින හෝ ඊට ආසන්න දිනක සිට මේ දක්වා කාල සීමාව තුළ මීරිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ "වලව්වත්ත නමැති ඉඩමේ ආරම්භයේ සිට ප්‍රධාන මාර්ගය දක්වා වන කොටසේ කාණු කැපීම" සඳහා වන කර්මාන්තය ගිවිසුමකින් තොරව පල්ලෙවෙල, වල්බෝලාන, අංක 72හි පදිංචි වයි. ඒ. අර්ජුන ධර්මප්‍රිය යන අයට පවරා ඉටු කිරීමට සැලැස්වීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තියට පටහැනිව ක්‍රියාකාර බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියෙහි 2(1)අ හා/හෝ 2(1)ඇ වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

(ඈ) ආනන්ද ප්‍රේමචන්ද්‍ර රණවීර මහතා 2011.04.04 දින හෝ ඊට ආසන්න දිනක සිට මේ දක්වා කාල සීමාව තුළ මීරිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ "වලව්වත්ත නමැති ඉඩමේ ආරම්භයේ සිට ප්‍රධාන මාර්ගය දක්වා වන කොටසේ කාණු කැපීම" සඳහා වන කර්මාන්තය විධිමත් සහා සම්මුතියකින් තොරව පල්ලෙවෙල, වල්බෝලාන, අංක 72හි පදිංචි වයි. ඒ. අර්ජුන ධර්මප්‍රිය යන අයට පවරා ඉටු කිරීමට සලස්වා ඒ වෙනුවෙන් මීරිගම ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලෙන් රුපියල් හතලිස් හත්දහස් හයසිය තිහක මුදලක් (රු. 47,630) හෝ ඊට ආසන්න මුදලක් ගෙවීම් කිරීමෙන් බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියෙහි 2(1)(ඈ) වගන්තියෙහි සඳහන් වරද සිදු කිරීම.

(ඇ) ආනන්ද ප්‍රේමචන්ද්‍ර රණවීර මහතා 2011.04.04 දින හෝ ඊට ආසන්න දිනක සිට මේ දක්වා කාල සීමාව තුළ මීරිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් මීරිගම ප්‍රාදේශීය සභාවට අයත් නව පුස්තකාලය ඉදි කරන භූමියේ පස් තුනී කිරීම හා කසළ ඉවත් කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව ටෙන්ඩර් කැඳවීමකින් තොරව පල්ලෙවෙල, වල්බෝලාන, අංක 72හි පදිංචි වයි. ඒ. අර්ජුන ධර්මප්‍රිය යන අයට පවරා ඉටු කිරීමට සැලැස්වීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 174 වගන්තියට පටහැනිව ක්‍රියාකර බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියෙහි 2(1)අ හා/හෝ 2(1)ඈ වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

(ඉ) ආනන්ද ප්‍රේමචන්ද්‍ර රණවීර මහතා 2011.04.04 දින හෝ ඊට ආසන්න දිනක සිට මේ දක්වා කාල සීමාව තුළ මීරිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් මීරිගම ප්‍රාදේශීය සභාවට අයත් නව පුස්තකාලය ඉදි කරන භූමියේ පස් තුනී කිරීම හා කසළ ඉවත් කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව ගිවිසුමකින් තොරව පල්ලෙවෙල, වල්බෝලාන, අංක 72හි පදිංචි වයි. ඒ. අර්ජුන ධර්මප්‍රිය යන අයට පවරා ඉටු කිරීමට සැලැස්වීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තියට පටහැනිව ක්‍රියාකර බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියෙහි 2(1)අ හා/හෝ 2(1)ඈ වගන්තිය/වගන්ති වල සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

(ඊ) ආනන්ද ප්‍රේමචන්ද්‍ර රණවීර මහතා 2011.04.04 දින හෝ ඊට ආසන්න දිනක සිට මේ දක්වා කාල සීමාව තුළ මීරිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් මීරිගම ප්‍රාදේශීය සභාවට අයත් නව පුස්තකාලය ඉදි කරන භූමියේ පස් තුනී කිරීම හා කසළ ඉවත් කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව විධිමත් සහා සම්මුතියකින් තොරව පල්ලෙවෙල, වල්බෝලාන, අංක 72හි පදිංචි වයි. ඒ. අර්ජුන ධර්මප්‍රිය යන අයට පවරා ඉටු කිරීමට සලස්වා ඒ වෙනුවෙන් විධිමත් සහා සම්මුතියකින් තොරව මීරිගම ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලෙන් රුපියල් තුන් ලක්ෂ තිස්පන් දහස් අටසිය තිහක මුදලක් (රු. 3,35,830) හෝ ඊට ආසන්න මුදලක් ගෙවීම් කිරීමෙන් බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියෙහි 2(1)ඈ වගන්තියෙහි සඳහන් වරද සිදු කිරීම.

(උ) ආනන්ද ප්‍රේමචන්ද්‍ර රණවීර මහතා 2011.04.04 දින හෝ ඊට ආසන්න දිනක සිට මේ දක්වා කාල සීමාව තුළ මීරිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාර්ග නඩත්තු කිරීම සඳහා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් "ඉමේෂී කන්ස්ට්‍රක්ෂන්ස් " ආයතනය වෙතින් ටෙන්ඩර් කැඳවීමකින් තොරව සේවය සඳහා ලබා ගැනීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 174 වගන්තියට පටහැනිව ක්‍රියාකර බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියෙහි 2(1)අ හා/හෝ 2(1)ඈ වගන්තිය/වගන්ති වල සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

(ඌ) ආනන්ද ප්‍රේමචන්ද්‍ර රණවීර මහතා 2011.04.04 දින හෝ ඊට ආසන්න දිනක සිට මේ දක්වා කාල සීමාව තුළ මීරිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාර්ග නඩත්තු කිරීම සඳහා "ඉමේෂී කන්ස්ට්‍රක්ෂන්ස් " ආයතනය වෙතින් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් යෙදවීමේදී ගිවිසුමකින් තොරව ක්‍රියා කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තියට පටහැනිව ක්‍රියාකර බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියෙහි 2(1)අ හා/හෝ 2(1)ඈ වගන්තිය/වගන්ති වල සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

(එ) ආනන්ද ප්‍රේමචන්ද්‍ර රණවීර මහතා 2011.04.04 දින හෝ ඊට ආසන්න දිනක සිට මේ දක්වා කාල සීමාව තුළ මීරිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාර්ග නඩත්තු කිරීම සඳහා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් "ඉමේෂී කන්ස්ට්‍රක්ෂන්ස් " ආයතනය වෙතින් විධිමත් සහා සම්මුතියකින් තොරව සේවය සඳහා යොදවා ගැනීමෙන් හා ඒ වෙනුවෙන් මීරිගම ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලෙන් රුපියල් තුන්ලක්ෂ අනූහය දහස් තුන්සියයක මුදලක් (රු. 3,96,300) හෝ ඊට ආසන්න මුදලක් විධිමත් සහා සම්මුතියකින්

තොරව ගෙවීම් කිරීමෙන් බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියෙහි 2(1)ඈ වගන්තියේ සඳහන් වරද සිදු කිරීම.

තව ද බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතන වල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව, පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද කොමසාරිස්වරයෙකු සතු බලතල මෙම ඒක පුද්ගල පරීක්ෂණ සභාව වෙත හිමිවන අතර, ඉහත සඳහන් කරුණු පරීක්ෂා කිරීමේදී අදාල කරගත යුතු බවට හඳුනාගත් ලිඛිත හා වාචික සාක්ෂි පහත උප ලේඛණයට ඇතුළත් කර ඇති බව ද වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය,
මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල හා බල ශක්ති,
මිනිස් බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය,
බස්නාහිර පළාත.

2013 ජනවාරි මස 17 වැනි දින,
කොළඹ 07, ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,
බස්නහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

*වාචික සාක්ෂි :*

1. ගම්පහ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ විමර්ශන නිලධාරී සම්පත් මහතා,
2. මීරිගම ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. පී. සිරිමාන්න මහතා,
3. මීරිගම ප්‍රාදේශීය සභාවේ හිටපු වැඩ බලන ලේකම් කේ. ඒ. කුමාරසිංහ මහතා,
4. මීරිගම ප්‍රාදේශීය සභාවේ සභා අභ්‍යන්තර විගණන නිලධාරී,
5. මීරිගම ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරී සී. ඒ. කේ. ගාල්ලගේ මහතා,
6. මීරිගම ප්‍රාදේශීය සභාවේ ගෙවීම් වවුචර් පිළියෙල කිරීමේ කළමනාකරණ සහකාර,

*ලිඛිත සාක්ෂි :*

1. මීරිගම ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් ගෙවීම් වවුචර් :

(i) 2012.01.18 දින අංක 54 දරන ගෙවීම් වවුචරය.
(ii) 2011.12.19 දින අංක 2390 දරන ගෙවීම් වවුචරය.
(iii) 2012.01.23 දින අංක 97 දරන ගෙවීම් වවුචරය.
(iv) 2011.12.20 දින අංක 2398 දරන ගෙවීම් වවුචරය.
(v) 2011.07.18 දින අංක 1276 දරන ගෙවීම් වවුචරය.
(vi) 2011.08.04 දින අංක 1425 දරන ගෙවීම් වවුචරය.
(vii) 2011.09.19 දින අංක 1730 දරන ගෙවීම් වවුචරය.
(viii) 2011.10.25 දින අංක 1946 දරන ගෙවීම් වවුචරය.
(ix) 2011.11.01 දින අංක 1998 දරන ගෙවීම් වවුචරය.
(x) 2011.11.25 දින අංක 2232 දරන ගෙවීම් වවුචරය.
(xi) 2011.12.30 දින අංක 2526 දරන ගෙවීම් වවුචරය.
(xii) 2012.01.30 දින අංක 129 දරන ගෙවීම් වවුචරය.
(xiii) 2012.02.16 දින අංක 274 දරන ගෙවීම් වවුචරය.

02-456

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.